**හික්කඩුව නගර සභාව - 2022**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

හික්කඩුව නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට හික්කඩුව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හික්කඩුව නගර සභාව සඳහා පරිගණක මෘදුකාංග පද්ධතියක් මිලදී ගැනීම සඳහා දරන ලද රු.3,895,125 ක වියදම අස්පෘශ්‍ය වත්කම් ලෙස ගිණුම් ගතකර නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | ඉකුත් වර්ෂය හා සමාලෝචිත වර්ෂයේ දරන ලද එකතු වටිනාකම රු.2,443,972 ක් වූ ගොඩනැගිලි ඉදිකිරීම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | - එම - | - එම - |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ පොදු වෙළඳපොල කඩ කාමර 07 කට අදාළව ලද එක්වන් මුදල් රු.2,106,060 ක් තැන්පත් ගිණුමකට බැර කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි. | - එම - | - එම - |
| (ඈ) | 2015, 2016 හා 2019 වර්ෂ වලට අයත් වසර 02 ක කාලසීමාව ඉක්ම වූ රු.36,727,100 ක මුද්දර ගාස්තු අධි වෙන්කිරීම් ගිණුම් ගතකර නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදි කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඉ) | සමාලෝචිත වර්ෂය තුළ කර්මාන්ත ණයහිමියන් සඳහා ගෙවීම් කර තිබුණු රු.465,879 ක මුදල කර්මාන්ත ණයහිමියන් ලෙස නැවත ගිණුම් ගත කර තිබුණි. | - එම - | - එම - |

### 1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 09 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.17,383,830 ක වෙනසක් විය. | ඉදිරියේ දී නිවැරදි කරන බව. | වෙනස්කම් සසඳා නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වේ. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2015 ජුලි 10 දිනැති අංක 02/2015රාජ්‍ය මුදල් චක්‍රලේඛ | සභාව සතු භාවිතයෙන් ඉවත් කරන ලද වාහන 07 ක් සම්බන්ධයෙන් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | වාහන 03 ක් අළුත්වැඩියා කර භාවිතා කරන බව හා ඉතිරි වාහන සම්බන්ධයෙන් ඉදිරියේ දී කටයුතු කරන බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.9,964,982 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.20,102,835 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කල ආදායම්, රැස් කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 21,176,683 | 21,729,523 | 26,538,285 | 42,317,680 | 26,546,450 | 21,259,116 | 14,657,190 | 47,126,442 |
| කුලී | 6,033,080 | 6,870,525 | 6,823,862 | 4,307,826 | 8,792,920 | 7,150,160 | 7,464,662 | 4,261,163 |
| බලපත්‍ර ගාස්තු | 935,000 | 565,375 | 565,375 | 48,355 | 815,000 | 344,160 | 346,155 | 48,355 |
| වෙනත් ආදායම් | 6,776,000 | 4,002,879 | 4,002,879 | - | 6,048,000 | 238,321 | 238,321 | - |
| | 34,920,763 | 33,168,302 | 37,930,401 | 46,673,861 | 42,202,370 | 28,991,757 | 22,706,328 | 51,435,960 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම රැස් කිරීම් කාර්යසාධනයට සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට මුළු හිඟ ආදායම රු.51,435,960 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ අවසානයට එය රු.46,673,861 ක් විය. | හිඟ ආදායම් ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ වරිපනම් හා බදු ආදායම රු.47,126,442 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ අවසානයට එය රු.42,317,680 ක් විය. වරිපනම් බදු හිමියන් 25 දෙනෙකුගෙන් අයවිය යුතු රු.100,000 කට වැඩි හිඟ ශේෂ වල වටිනාකම රු.5,367,116 ක් විය. | හිඟ ශේෂ ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතු වේ. |
| (ඇ) | සභාව සතු කඩ කාමර 09 ක් 2017 වර්ෂයේ සිට ටෙන්ඩර් කර බදු දීමට සභාව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී කටයුතු කරන බව. | ටෙන්ඩර් කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඈ) | හික්කඩුව නගර සභාවට අයත් කඩ කාමර 84 ක ගිවිසුම් කාලය අවසන් වී තිබූ අතර, සෑම ගිවිසුමක්ම වසර 03 කට වරක් යාවත්කාලීන කළයුතු වුවද, සභාව එපරිදි කටයුතු කර නොතිබුණි. | ගිවිසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කරමින් පවතින බව. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඉ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් මුද්දර ගාස්තු වෙනුවෙන් රු.75,806,212 ක් ලැබිය යුතුව තිබුණි. | ලිපි මගින් ගාල්ල ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයට යොමු කර ඇති බව. | හිඟ ආදායම් කඩිනමින් අය කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 වර්ෂය තුළදී සභාවට රු.1,200,000 ක් වැය කර කසළ කැබලි කිරීමේ යන්ත්‍රයක් ගෙනවිත් සවිකර තිබුණි. එම යන්ත්‍රය සභාවේ කසළ කළමනාකරණය සඳහා යොදාගෙන නොතිබුණු අතර, සභාවට දිගුකාලීන කසළ කළමනාකරණය පිළිබඳ සැලැස්මක් නොතිබුණි. | යාන්ත්‍රික ඉංජිනේරු මගින් යන්ත්‍රය පරීක්ෂා කර වාර්තාවක් ලබා දෙන ලෙස නගර සභාව මගින් ඉල්ලීමක් කර ඇති බව. | වත්කම් වලින් ප්‍රයෝජන ගත යුතු අතර, කසළ කළමනාකරණය සඳහා වැඩපිළිවෙලක් සකස් කළ යුතු වේ. |

### 3.2 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2005 වර්ෂයේ දී රුපියල් ලක්ෂ 300 ක් හා 2017 වර්ෂයේ දී රු.7,570,456 ක් වැය කර ඉදිකර තිබුණු හික්කඩුව පොදු වෙළඳ පොල ගොඩනැගිල්ලේ ඉහල මහල 2006 වර්ෂයේ සිට නිෂ්කාර්යව පැවතුණි. | ආපනශාලාවක් ලෙස සකස් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | වත්කම් ඵලදායී කාර්යයන් සඳහා යොදාගත යුතු වේ. |

### 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 මැයි 09 දින කොළඹ ගොස් නැවත සභාව වෙත පැමිණීමේ දී සභාව සතු රු.6,400,000 ක් වටිනා වෑන් රථය කලහකාරීන් විසින් සම්පූර්ණයෙන්ම විනාශ කර තිබුණ ද, අලාභ හානිය සම්බන්ධයෙන් මු.රෙ.104 අනුව කටයුතු කර නොතිබුණි. | පරීක්ෂණය සඳහා කමිටුවක් පත් කිරීමට අදාළව උපදෙස් ලේකම් වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව හානි සම්බන්ධයෙන් වාර්තාවක් ලබා ගත හැකි බව. | පරීක්ෂණයක් පවත්වා ඊට අදාළ ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (ආ) | සභාවට වෙනත් ආයතනවලින් ලබා දී තිබූ රු.6,040,000 ක් වටිනා වාහන 04 ක් හා වටිනාකම සඳහන් නොවූ ට්‍රේලර් 02 ක් පවරා ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීමට කටයුතු කරන බව. | පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. |

### 3.4 ව්‍යාපෘති, කර්තව්‍යයන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හික්කඩුව නගර සභාවේ සේවාවන් කාර්යක්ෂම කර ගැනීම සඳහා ස්ථාපිත කර තිබුණු රු.1,945,000 ක මෘදුකාංග පද්ධති 02 ක් අවුරුදු 01 යි මාස 09 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | 2023 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කරන බව. | කාර්යාල කටයුතු කාර්යක්ෂමව ඉටු කරවා ගැනීමට මෘදුකාංග පද්ධති යොදා ගත යුතු වේ. |
| (ආ) | හික්කඩුව නගර සභාව සතු කොහුඅඹේ පිට්ටනිය පස් පුරවා සංවර්ධනය කිරීම සඳහා රු.833,007 ක මුදලක් ගෙවා තිබුණ ද, 2022 දෙසැම්බර් 31 දින වන විටත් කර්මාන්තයේ වැඩ අවසන් කර නොතිබුණ අතර, පිට්ටනියේ කොටසක පිටතින් ගෙනෙන ලද කුණු දමා තිබුණි. | ඉදිරියේ දී කටයුතු කරන බව හා පිට්ටනියේ කොටසක දමා ඇති කුණු ඉවත් කර ඇති බව. | කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම් ගත පරිදි කටයුතු කළ යුතු වේ. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ සේවය කර විශ්‍රාම ගිය, ස්ථාන මාරු වූ හා සේවය අත්හිට වූ සේවකයින් 16 දෙනෙකුගෙන් රු.949,601 ක ණය ශේෂයක් අයවිය යුතුව පැවතුණි. | අදාළ ණය මුදල් අය කර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | අයවිය යුතු සේවක ණය කඩිනමින් අය කළ යුතු වේ. |